# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1356/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 22/08/2024<br>පැය 1000 |

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.08.22 වන අද දින සම සෞඛ්‍ය උපාධිදාරී එකමුතුව සහ අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය මඟින් මරදාන සෞඛ්‍ය අමාත්‍යාංශය අසල මාර්ග වල ගමනාගමනය අවහිර වන පරිදි වාහන වලට හා මහජනතාවට බාධාකාරී වන ලෙසට විරෝධතාවක් පැවැත්වීමට කටයුතු කරන බවට ලද බුද්ධි තොරතුරක් මත ස්ථානාධිපති මරදාන විසින් මාලිගාකන්ද ගරු මහෙස්ත්‍රාත් අධිකරණයෙන් මෙම විරෝධතාවය වලක්වන ලෙසට ඉල්ලීමක් සිදු කර ඇත . ඒ අනුව ,

1. තරුෂාන් හේරත් ( සම සෞඛ්‍ය විද්‍යා උපාධිදාරී එකමුතුවේ කැඳවුම්කරු)
2. මධුෂාන් චන්ද්‍රජිත් ( අන්තර් විශ්ව විද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු) ඇතුළු වගඋත්තරකරුවන් සහ සහභාගී වන තවත් අය සඳහා

2024.08.22 වන අද දින පැය 10.00 සිට පැය 21.00 දක්වා සෞඛ්‍ය අමාත්‍යාංශය අසල ඒකරාශී වී අවට ඇති මහා මාර්ගය, පදික වේදිකා භාවිතා කල නොහැකි ලෙස අහුරමින් සිදු කරන උද්ඝෝෂණ හා සෞඛ්‍ය අමාත්‍යාංශයට ඇතුල් වීම වළක්වාලමින් තහනම් නියෝගයක් මාලිගාකන්ද ගරු මහෙස්ත්‍රාත් අධිකරණය මගින් නිකුත් කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**